(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 183.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2017 ජූලි මස 27 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1046/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය පිළිබඳ අභියාචනා විභාගය අවසන් කරනු ලැබුවද පළාත් පාලන මැතිවරණ නීතියේ පවතින අඩුපාඩු හේතුවෙන් පළාත් පාලන මැතිවරණ පැවැත්වීමට නොහැකි බවට මැතිවරණ කොමිසම හෝ එහි පූර්වගාමී මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දී තිබේද;

(ii) එසේ නම්, එම අඩුපාඩු කවරේද;

(iii) එකී අඩුපාඩු අතරින් මැතිවරණය පැවැත්විය නොහැකි මට්ටමේ අඩුපාඩු තිබේ නම්, ඒවා කවරේද;

(iv) එකී අඩුපාඩු මැතිවරණ කොමිසම හෝ එහි පූර්වගාමී මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව දැනුම් දුන් දිනය කවරේද;

(v) එකී අඩුපාඩු සැකසීමට මෙතෙක් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1051/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහනගර සභා බලප්‍රදේශය තුළ පිහිටි රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ කවරේද;

(ii) එම අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන රජයේ ගොඩනැගිලි කවරේද;

(iii) බදු කුලී ගෙවන හා නොගෙවන අමාත්‍යාංශ, එක් එක් ගොඩනැගිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බදු ගෙවන අමාත්‍යාංශ, එක් වර්ග අඩියක් සඳහා ගෙවනු ලබන බදු කුලිය හා සේවා ගාස්තුව, එක් එක් ගොඩනැගිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගොඩනැගිලිවල රථගාල් සඳහා ගෙවීමක් සිදු කරන්නේද;

(vi) එසේ නම්, එම මුදල කොපමණද;

(vii) රථ සංඛ්‍යාව අනුව සිදු කරන එම ගෙවීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහනගර සභා බලප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ කවරේද;

(ii) එම අමාත්‍යාංශ පවත්වාගෙන යන ගොඩනැගිලි කවරේද;

(iii) එම ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා ගෙවනු ලබන බදු මුදල හා සේවා ගාස්තුව, එක් එක් ගොඩනැගිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ගොඩනැගිලිවල රථගාල් සඳහා ගෙවීමක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1076/'16

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් හපුතලේ ඉඩම්වල වසර 75කට අධික කාලයක සිට මේ දක්වා පදිංචිව සිටින ජනතාවගෙන් වාර්ෂිකව බදු අයකරන බවත්;

(ii) මෙම වාර්ෂික බද්ද 1970 දී, රු. 75/- ත් රු. 80/- ත් අතර ගණනක් වූ අතර මේ වනවිට එය රු. 10,000/- ත් රු. 25,000/- අතර ගණනක් දක්වා වැඩිකර ඇති බවත්;

(iii) එකම ඉඩමේ කොටසක පදිංචි පුද්ගලයන් සඳහා ඔප්පු මඟින් හිමිකම පවරා දී තිබියදී, එම ඉඩමේම වෙනත් කොටසක පදිංචි පුද්ගලයන්ට බදු ගෙවන මෙන් දන්වා ඇති බවත්;

(iv) බදු මුදල් නොගෙවන්නේ නම්, ඉඩම්වලින් ඉවත්වන ලෙස දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1930 වර්ෂයේ සිට මේ දක්වා මෙම ඉඩම්වල පදිංචිව සිටින මෙම පිරිසගෙන් වර්තමානයේ අයකරන අධික බදු මුදල අඩු කිරීමට පියවර ගන්නේද;

(ii) මෙම ඉඩම් ඒවායේ පදිංචිකරුවන්ට පවරා දීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1116/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 සිට 2016 වර්ෂය දක්වා බණ්ඩාරවෙල නගර සභාවට,

(i) පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය;

(ii) පළාත් සභාව මඟින් ලබා දුන් මුදල් ප්‍රමාණය;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 සිට 2016 වර්ෂය දක්වා පළාත් පාලන අමාත්‍යාංශය හා ඌව පළාත් සභාව මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ වෙනත් පළාත් පාලන ආයතන සඳහා ලබා දුන් මුදල් ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1171/’16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරේහි පැවති “දැයට කිරුළ” ප්‍රදර්ශනය සඳහා පැමිණි ආරාධිතයන්ට ආරක්ෂාව සැලසීම සහ වාහන නවතා තැබීම පිණිස වලතාපිටිය ප්‍රදේශවාසීන්ගේ කුඹුරු ඉඩම් ආරක්ෂක හමුදා විසින් තාවකාලිකව පවරාගත් බවත්;

(ii) මෙම ඉඩම් පාවිච්චි කිරීම වෙනුවෙන් කිසිදු ගෙවීමක් සිදුකර නොමැති බවත්;

(iii) දැනට හිස්ව පවතින මෙම ඉඩම්වල වගා කිරීමට ඉඩම් අයිතිකරුවන් උත්සාහ කළද, ඒ සඳහා හමුදා නිලධාරීන් ඉඩ ලබා නොදෙන බවත්;

(iv) එම ඉඩම්, අයිතිකරුවන්ට ලබාදීමට මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉඩම් යළි අයිතිකරුවන්ට ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1193/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද්ධමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1308/’16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය කරනු ලැබුවේ තමා බවට පාපොච්චාරණයක් සටහන් තබමින් කෑගල්ල ප්‍රදේශයේ විශ්‍රාමික බුද්ධි අංශ සාමාජිකයෙකු දිවිනසාගෙන ඇති බවට වාර්තා පළවී ඇති බවත්;

(ii) එය දිවිනසා ගැනීමක්ද; නැතහොත්, ඝාතනයක්ද; යන්න පිළිබඳ සැක සහිත බව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයා විශේෂ මාධ්‍ය හෙළිදරව්වක් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විශ්‍රාමික බුද්ධි අංශ සාමාජිකයාගේ මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, වෛද්‍ය නිගමනය කවරේද;

(iii) සිදුවී ඇත්තේ සිය දිවිනසා ගැනීමක් නොවේ නම්, මරණයට අදාළ වූ හේතූන් කවරේද;

(iv) එයට වගකිවයුත්තන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වගකිවයුතු පුරවැසියෙක් වශයෙන් නියෝජ්‍ය අමාත්‍යවරයා කර ඇති ප්‍රකාශය පිළිබඳ යම් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය පිළිබඳ පරීක්ෂණයේ වත්මන් තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1381/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 149 යෝජනාවට අනුව, අනුරාධපුර, වව්නියා සහ කිළිනොච්චි දිස්ත්‍රික්කයන්හි කෘෂි හා පශු සම්පත් මත්ස්‍ය සැකසුම් කලාපයන් පිහිටුවීමට රුපියල් මිලියන 100ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපෘති තුන සඳහා ශක්‍යතා වාර්තා පිළියෙළ කරනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) ඒ අනුව, මෙකී ව්‍යාපෘති තුන සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය කොපමණද;

(iv) මෙකී ව්‍යාපෘති තුන සඳහා, 2016 වර්ෂාවසානය වනවිට මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(v) 2017 වර්ෂයට ඉහත ව්‍යාපෘති වෙනුවෙන් ලබා දිය හැකි මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1466/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තුළ පදිංචි අඩු ආදායම්ලාභී පවුල් සඳහා මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදල්වලින් නොමිලේ සෙවිලි තහඩු බෙදා දුන් බව පිළිගන්නේද;

(ii) විමධ්‍යගත අරමුදල් යොදාගනිමින් මන්ත්‍රීවරයන් විසින් සිදු කරනු ලැබූ සෙවිලි තහඩු බෙදාදීම තහනම් කර තිබේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම තහනම ඉවත්කර, පෙර තිබූ පරිදි මන්ත්‍රීවරයන්ගේ මාර්ගයෙන් සෙවිලි තහඩු බෙදාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1478/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ, මධ්‍යම රජය සහ පළාත් සභාව යටතේ පාලනය වන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් ස්ථිර විදුහල්පතිවරයන් සිටින පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට වැඩබලන විදුහල්පතිවරයන් සිටින පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල නම් කවරේද;

(iv) පසුගිය වසරේ පවත්වනු ලැබූ විදුහල්පතිවරයන් බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් වයඹ පළාතෙන් සමත් වූ සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(v) එම විභාගය සමත් වූ පිරිස දැනට නිවැරදිව සේවා ස්ථානගත කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1598/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "රටම එළියයි - අඳුර දුරලයි" ජාතික විදුලි සත්කාරය වැඩසටහන ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම වැඩසටහන යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම (ලෙකෝ) විසින් විදුලිය ලබා දී ඇති නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වැඩසටහන සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ වනවිට ශ්‍රී ලංකාවේ නිවාස ඒකක අතරින් කොපමණ ප්‍රතිශතයකට විදුලිය සපයා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1603/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ නගරයට විදුලිය සපයන ප්‍රධාන භූගත විදුලි සැපයුම් මාර්ගයක් වසර 03ක පමණ සිට අක්‍රීයව පවතින බව දන්නේද;

(ii) එම මාර්ගයේ විදුලි සැපයුම් ධාරිතාවය කොපමණද;

(iii) එකී සැපයුම් මාර්ගය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පියවර ගැනීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(iv) එකී සැපයුම් මාර්ගය අලුත්වැඩියා කිරීම ප්‍රමාද වීම පිළිබඳව වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද;

(v) එම එක් එක් නිලධාරියාට එරෙහිව අමාත්‍යාංශය හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙතෙක් ගෙන ඇති විනයානුකූල පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) කොළඹ නගරයේ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා සම්ප්‍රේෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1609/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව, එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම සේවකයන් අතරින් වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් වීමට ඉල්ලුම් කර ඇති සේවක සංඛ්‍යාව, එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය කාලසීමාව තුළ මෙම සේවකයන් සඳහා සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම ක්‍රමානුකූලව සිදුවී තිබේද;

(iv) ඔවුන් වෙත වන්දි ලබා දෙන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1707/'17

ගරු විදුර වික්‍රමනායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ව්‍යවසායකයන් සවිබලගැන්වීම පිණිස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා ක්ෂුද්‍ර කර්මාන්ත සඳහා සහන පොලී පදනමක් මත, වසර දෙකක සහන කාලයක්ද සහිතව SMILE III ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද බවත්;

(ii) ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2016 ජූලි මස 10 වැනි දින පුවත්පත් දැන්වීම් පළකර, ණය ලබාදීම පිළිබඳව ප්‍රචාරය කරන ලද බවත්;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීමට වාණිජ බැංකු දහයක් ඉදිරිපත් වූ අතර, ණය අයදුම්කරුවන් පන්දහසක් පමණ එම ණය අපේක්ෂාවෙන් ඉදිරිපත් වුවද ණය ලබාදීම නවතා ඇති බවත්;

(iv) බොහෝ ව්‍යවසායකයන් විසින් අවශ්‍ය මූලික වියදම් දරමින් ඇප ඔප්පු අත්සන් කිරීම සහ උකස් ඔප්පු සකස් කිරීම වැනි කටයුතු අවසන්කර ඇතත්, ණය ලබාදී නොමැති බවත්;

(v) මෙම තත්ත්වය හේතුවෙන් නව ව්‍යාපාර සහ ව්‍යාපාර වැඩිදියුණු කිරීම්, අතරමඟ නැවතී ඇති අතර එය ජාතික ආර්ථිකයටද බලවත් පහරක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ණය මුදල් ලබාදීමට හැකියාවක් නොමැති නම්, 2016.07.10 දින පුවත්පත් දැන්වීම් ප්‍රචාරය කර ජනතාව අපහසුතාවයට පත් කරන ලද්දේ මන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1328/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති සුළං විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරයන්ගෙන් විදුලි ඒකකයක් ලංකා විදුලිබල මණ්ඩලය ලබා ගන්නා මිල, එක් එක් බලාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම බලාගාර අතරින් සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් බලාගාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලිමංකඩ ඉදිකරන නව සුළං බලාගාරයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ඒකකයක් ලබාදෙන මිල කවරේද;

(ii) සුළං බලාගාරයන්ගෙන් විදුලිය ඒකකයක් අඩුම මිලකට ලබා ගැනීමට රජය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනාව,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සහ රේගු ආඥා පනතේ අරමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම, ගබඩා කිරීම, භාරදීම හෝ ඉවත් කිරීමට අදාළව සිදු කළ යුතු හෝ අත්‍යාවශ්‍ය වන සියලුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම යන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජන ජීවිතය පවත්වා ගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන බව සැලකිල්ලට ගනිමින් හා එම සේවාවන් සැපයීමට අවහිරයක් හෝ බාධාවක් ඇති වීමට හැකියාවක් පැවතීම හේතුවෙන් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් ඉහත කී වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් බවට ජනාධිපතිවරයා විසින් 2017 ජූලි 25 දිනැති අංක 2029/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මඟින් 2017 ජූලි 25 දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු යැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2017 ජූලි 26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. )

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග,— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වගන්තියේ (ඉ) ඡේදය සහ 21 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 වගන්තිය යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*3.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*5.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

දේශීය ආදායම් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවට හා 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 3 හා 3 (4) වගන්ති ප්‍රකාරව, මානව හිමිකම් ක්ෂේත්‍රය පිළිබඳ පෘථුල දැනුමක් හා ප්‍රායෝගික අත්දැකීම් සහිත පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුවේ අංශාධිපතිනිය ලෙස සේවය කරන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ලෙස වසර තුනක (03) කාලයක් සඳහා 2015.10.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජනාධිපතිවරයා විසින් පත්කර ඇති හෙයින්ද;

2015.10.30 දින සිට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය වසර තුනක (03) සේවා කාලයෙන් පසු නැවත සිය නිත්‍ය තනතුරට යාමට අදහස් කරන අතර, මෙම වසර තුනක (03) සේවා කාලය තුළ සියලු දීමනා ඇතුළත් විශ්වවිද්‍යාල වැටුප ඇයට අහිමි වුවහොත් ඇයගේ සේවක ප්‍රතිලාභ කෙරෙහි අහිතකර බලපෑමක් සිදුවන බව ඇය විසින් දන්වා ඇති හෙයින්ද;

ඊට අනුකූලව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වත්මන් සභාපතිනිය වන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය වෙත ඇයට පෞද්ගලික වන සේ ඇය සේවය කරන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුවේ අංශාධිපතිනිය ලෙස සියලු දීමනා ඇතුළත් පූර්ණකාලීන කථිකාචාර්ය මාසික වැටුප 2015.10.30 දින සිට ගෙවීමටත්, කොමිෂන් සභාවේ සභාපති තනතුරට හිමි රු.10,000/-ක මාසික දුරකථන දීමනාව, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොලේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක් ගෙවීමටත් 2017.06.13 දින අමාත්‍ය මණ්ඩලය අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය වන ආචාර්ය නෙලුම් දීපිකා උඩගම මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*15.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 27 දිනැති අංක 2012/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

16.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---